# ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
## ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය
## පුරප්පාඩු

**1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර, සෑම සුක්කානමක් පිටුපසම නිරෝගීමත් රියදුරෙකු හිඳුවීම අපගේ දැක්ම වේ.**
**ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන්, අප ආයතනය ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීමට වෘත්තිකයන්ගේ දායකත්වය අවශ්‍ය බැවින් පහත පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## වෛද්‍ය රසායනාගාර තාක්ෂණික විද්‍යාඥ , කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) හා රසායනාගාර සහකාර

### 1. වෛද්‍ය රසායනාගාර තාක්ෂණික විද්‍යාඥ – MA 4 – පුරප්පාඩු සංඛ්‍යාව – 01

**සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෛද්‍ය රසායනාගාර තාක්ෂණික විද්‍යාඥ උපාධියක් ලබා තිබීම සහ රසායනාගාර තාක්ෂණික විද්‍යාඥ ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.
2. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත් ආයතනයකින් වෛද්‍ය රසායනාගාර තාක්ෂණික විද්‍යාඥ තනතුරට අදාළව ලබාගන්නා ලද වෘත්තීය සහතික පත්‍රයක් හෝ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම සහ රසායනාගාර තාක්ෂණික විද්‍යාඥ ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

- **වයස:-** අවුරුදු 22 ට නොඅඩු හා අවු.45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.
- **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br><br>2025.03.25 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2025 උපලේඛනය II පරිදි වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | MA 4 - 2025<br>රු. 64,320 – 10×1,360 – 15×1,670 – 5×2,040 – 113,170 |

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරණ චක්‍රලේඛයට අනුව මෙම වැටුප අදාළ වන්නේ 2027.01.01 දින සිටය. 2025.04.01 දිනට ගෙවන වැටුප රු.52,875 ක් වේ.)

### 2. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - MA 1-1 – පුරප්පාඩු සංඛ්‍යාව – 12

**සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.
2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.
3. පිළිගත් පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‘2’, ‘3’, ‘4’ සහ ‘5’ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.
2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.
3. පිළිගත් පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
4. සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.
5. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

### 3. රසායනාගාර සහකාර - MA 1-1 – පුරප්පාඩු සංඛ්‍යාව - 01

**සුදුසුකම්**
**බාහිර අයදුම්කරුවන්**

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය හා විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.
2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.
3. පිළිගත් පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‘2’, ‘3’, ‘4’ සහ ‘5’ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.
2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය හා විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම
3. සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.
4. පිළිගත් පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
5. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

- **වයස :-** අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :-**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br>2025.03.25 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2025 උපලේඛනය II පරිදි වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | MA 1-1 - 2025<br>රු. 46,220-10× 540-7×630- 4×890- 20×1,190-83,390 |

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරණ චක්‍රලේඛයට අනුව මෙම වැටුප අදාළ වන්නේ 2027.01.01 දින සිටය. 2025.04.01 දිනට ගෙවන වැටුප රු.40,403 ක් වේ.)

**ඉහත තනතුරු සඳහා අවශ්‍ය පොදු සුදුසුකම්:-**
සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සතු වේ.
**සියළුම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් සකස් කර අදාළ සහතිකවල සහතික කළ පිටපත්ද සමඟ ඥාති නොවන දෙදෙනෙකුගේ නම, ලිපිනය, දුරකථන අංකය සහිතව පහත ලිපිනයට 2026.05.09 දින හෝ ඊට ප්‍රථම අයදුම් කරන තනතුර ද ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.**


**සභාපති,**
**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,**
**අංක 170, හයිලෙවල් පාර,**
**නුගේගොඩ.**
**දුරකථන :- 011 2852868**